**සත්වෝද්‍යාන සංවර්ධන හා සුහසාධක අරමුදල - 2017**

**-----------------------------------------------------------**

සත්වෝද්‍යාන සංවර්ධන හා සුහසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 8(5) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI – 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

(අ) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.41,677,205 ක් වූ වත්කම් වර්ග 08 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒඅනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි 69 ඡේදය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම එම වත්කම පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව සිදුකළ යුතු බව දක්වා තිබුණද ඊට පටහැනිව අරමුදල විසින් වත්කම් මිලදී ගත් වර්ෂයටම ක්ෂය කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කර තිබුණි. ඒ හේතුවෙන් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය වෙන් කිරීම් රු.37,450,474 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවා සපයන ආයතනයක් වශයෙන් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙහි සත්වෝද්‍යාන අරමුදලට අදාළව රැස්කරන ප්‍රධාන ආදායම වන ප්‍රවේශ පත්‍ර අලෙවි ආදායමෙන් විකුණුම් පිරිවැය ලෙස වර්ෂය තුළ භාවිත කළ සත්ව ආහාර, සත්ව ඖෂධ හා ප්‍රවේශ පත්‍ර මුද්‍රණ වියදම වූ රු.269,066,681 ක අගය විකුණුම් පිරිවැය ලෙස ගලපා දළ ලාභය ගණනය කිරීම විධිමත් නොවන බව නිරීක්ෂණය වේ.

(ආ) සමරු පොත් අලෙවි කිරීම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගයෙන් පරිබාහිර කටයුත්තක් වන බැවින් ඊට අදාළව ලාභය හෝ අලාභය වෙනම ගණනය කර අරමුදලේ අතිරික්තය/ඌනතාවයට ගැලපිය යුතු වුවත් අරමුදල විසින් එසේ සිදු නොකර ඉන් ලද රු.86,972 ක් වූ ආදායම වෙනත් ආදායම් ලෙස හා ඊට අදාළ විකුණුම් පිරිවැය ප්‍රධාන මෙහෙයුම්වලට අදාළ විකුණුම් පිරිවැයෙහි දක්වා තිබුණි.

(ඇ) විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී සමරු භාණ්ඩ ආරම්භක තොග ශේෂය රු.1,004,237 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) අරමුදලට අදාල කොන්ත්‍රාත් 30 ක් සඳහා සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුවේ පොත්වල සටහන් කර තිබුණු සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු සහ ව්‍යවස්ථාපිත රඳවා ගැනීම් පිළිවෙලින් රු.733,222 ක් හා රු.545,000 ක් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භවීමට මාස 3 කට පෙර අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කර පැවතියේ 2018 මාර්තු 08 දිනදීය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.507,779,651 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.581,182,256 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.73,402,605 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ විකුණුම් ආදායම රු.99,285,580 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරික්තය වැඩි වී තිබුණද 2016 හා 2017 වර්ෂවල අතිරික්තය අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් හා රජයට ගෙවූ බදු නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.455,874,028 ක් වූ දායකත්වය 2015 වර්ෂය වනවිට රු.715,337,322 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එය රු.637,250,621 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4. 1 කාර්යසාධනය

----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත අනුව වූ අරමුදලේ අරමුණුවලින් පහත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i) ජාතික සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ පරිපාලන කටයුතු වෙනුවෙන් නිලධාරීන් සහ සේවක පිරිසක් බඳවා ගැනීම.

(ii) දෙහිවල සත්වෝද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන්නන්ගේ වාහන නවතා තැබීම පිණිස විශේෂ පෙදෙස් සැපයීම.

(iii) සත්ව උද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම හා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් උපදේශක කාරක සභාවක් පත් කිරීම.

(iv) ඉහත උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකම දෙවරක් පැවැත්වීම.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.168,500,000 ක් වූ ව්‍යාපෘති 16 කින් ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.50,500,000 ක් වූ ව්‍යාපෘති 10 ක් විගණිත දිනය වූ 2018 මැයි වන විට ආරම්භ කර නොතිබූ අතර වැඩ ආරම්භ කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.118,000,000 ක් වූ ව්‍යාපෘති 06 ක් විගණිත දිනය වූ 2018 මැයි මස වන විට අවසන් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ සංචාරයට පැමිණෙන විදේශ සංචාරකයින් 2012 වර්ෂයේ සිට ක්‍රමානුකූලව වැඩි වී තිබූ අතර ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ විදේශ සංචාරකයින් පිළිවෙලින් 2,050,832 දෙනෙකු හා 2,116,407 දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණ තිබුණි. එහෙත් සත්වෝද්‍යානය නැරඹීමට පැමිණ තිබුණු විදේශ සංචාරකයින් සංඛ්‍යාව පිළිවෙලින් 415,776 හා 369,685 පමණක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සත්වෝද්‍යානය නැරඹීමට පැමිණි විදේශ සංචාරකයින් සංඛ්‍යාව සියයට 11 කින් අඩු වී තිබුණි. එසේම නිදහස් පරිසරයක් තුළ ඉදි කෙරුණු රිදියගම හා වාගොල්ල වැනි සත්වෝද්‍යාන වෙත පැමිණෙන විදේශීය හා දේශීය සංචාරකයන්ගේ පැමිණීම ඉහළ ගොස් තිබුණි. සංචාරක ආකල්ප හා අපේක්ෂාවන්ගේ වෙනස්වීම් වලට සරිලන ආකාරයට පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ පිහිටි ආහාර අලෙවිසැල් දෙකක් සහ එක් සමරු අලෙවිසැලක්ද, හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානයේ ආපන ශාලා දෙකක් සහ සමරු අලෙවිසැල් දෙකක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් රජයේ ආයතන 03 ක් වෙත බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව බදු කුලී පදනම මත ලබා දී තිබුණි.

(ආ) පින්නවල අලි අනාථාගාරය සහ වාගොල්ල සත්වෝද්‍යානයට අදාල 2018 මැයි මස සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පින්නවල අලි අනාථාගාරයට පොල් අතු සැපයීම් ප්‍රසම්පාදනයේදී අදාළ පිරිවිතරයන් වූ පොල් අතුවල කොළ පටන් ගන්නා ස්ථානයේ සිට ඉවතට තැබිය හැකි පිත්තේ උපරිම දිග අඟල් 06 ක් වුවද නිරීක්ෂණයට ලක්කළ නියැදියෙහි සපයන ලද පොල් අතුවල පිත්තෙහි දිග ප්‍රමාණය අඩි 01 ත් 05 ත් අතර විය. පරීක්ෂා කල නියැදියට අදාලව අඟල් 6 ට වැඩි පිතිවල ශුද්ධ බර ප්‍රමාණය කිලෝග්‍රෑම් 200 ක් පමණ වූ අතර බරට අනුව එම පිතිවල වටිනාකම රු.5,960 ක් විය. මෙය වාර්ෂිකව සැපයිය යුතු ප්‍රමාණය සමඟ සැසඳීමේදී එලෙස අඟල් 6 ට වැඩි දිග පිති ලෙස ඇස්තමේන්තුගත වන ප්‍රමාණය රු.4,353,720 ක් වටිනා කිලෝග්රෑම් 146,000 ක් පමණ විය.

(ii) පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන් සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් සපයන පොල් අතුවල නියමිත බර ප්‍රමාණය, ගුණත්වය හා ප්‍රමිතිය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.

(iii) පින්නවල අලි අනාථාගාරයට පොල් අතු සැපයීම කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ලබා දී තිබුණද සියළුම සැපයුම් එක්අයකු විසින් පමණක් සිදුකර තිබීම.

(iv) පින්නවල අලි අනාථාගාරයේ සත්ව මළ ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට යොමු කිරීමට කටයුතු නොකර අක්‍රමවත්ව බැහැරකර තිබීම.

(v) පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව රෝහලේ එක්ස්-රේ යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අක්‍රීයව පැවති බැවින් අත්‍යාවශ්‍ය විකිරණ කටයුතු බාහිර රෝහල්වලින් සිදුකර ගැනීමට සිදුව තිබීම.

(vi) පින්නවල අලි අනාථාගාරයේ බෙහෙත් ගබඩාවෙහි කල් ඉකුත් වූ හා අපහරණය කිරීම සඳහා යෝජිත භාණ්ඩ පැවතීම, සමහර බෙහෙත් ද්‍රව්‍ය අක්‍රමවත්ව ගබඩා කර පවතීම සහ ගබඩාව තුළ වායු සමීකරණ යන්ත්‍රයක් නොමැති වීම.

(vii) පින්නවල අලි අනාථාගාරයේ සහ වාගොල්ල සත්වෝද්‍යානයේ ටිකට්පත් ගබඩා කිරීමට ආරක්ෂිත සේප්පු නොවූ අතර ටිකට්පත් අනාරක්ෂිතව මුදල් අයකැමි අංශය තුළ තබා තිබීම සහ මුදල් අයකැමිවරු විසින් ටිකට්පත් අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කර නොතිබුණු අතර ටිකට්පත් ලේඛනයට ඇතුළත් කර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම.

(viii) පින්නවල අලි අනාථාගාරයේ 2013 වර්ෂයේ සිට ටිකට්පත් මිල වැඩි කර තිබුණද විගණිත දිනය වූ 2018 ජූනි 01 දින වන විටත් 2013 වර්ෂයේදී මුද්‍රණය කරන ලද ටිකට්පත් භාවිත කරමින් පැවති අතර 2013 වර්ෂයේදී මුද්‍රණය කළ පිරිවැය රු.445,300 ක වටිනා ටිකට් පත් 289,000 ක තොගයක් ඉතිරිව පැවතීම.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

අයවැයගත ඇස්තමේන්තුව අනුව අධ්‍යාපන හා පර්යේෂණ වියදම්, සමරු භාණ්ඩ, සතුන් හුවමාරුව සහ සතුන් බෝ කිරීම, වෙනත් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.1,500,000 ක්, රු.1,000,000 ක්, රු.1,400,000 ක් හා රු.50,000,000 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය වෙනුවෙන් වෙන් කළ රු.1,000,000 ප්‍රතිපාදනයෙන් සියයට 76 ක්ද, හම්බන්තොට හා පින්නවල සත්වෝද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා වෙන්කළ රු.300,000,000 ප්‍රතිපාදයෙන් සියයට 81 ක්ද උපයෝජනය කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

වටිනාකම රු.9,584,223 ක් වූ මෝටර් රථ 04 ක් 2014 වර්ෂයේ සිට විගණිත දින වූ 2018 ජූනි දක්වා භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියකුගෙන් පමණක් සමන්විත විය. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය සුදුසු පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 5.2.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

වාගොල්ල සත්වෝද්‍යානයෙහි ඇස්තමේන්තු පිරිවැය රු. 59,977,712 ක්වූ කිඹුල් අරන ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කිඹුලන් සිටින විල හරහා ඉදි කර තිබූ ලී පාලම සඳහා අනුමත ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් වූ කුඹුක් දැව වෙනුවට තුලාන් දැව භාවිත කර තිබුණි. එම භාවිතා කරන ලද දැව දිරාපත් වෙමින් පැවතීම හේතුවෙන් ඊට ප්‍රවේශවීම පාලන අධිකාරිය විසින් තහනම් කොට තිබූ බවද, පිවිසුම් මාර්ගයේ දැව අත්වැට (Hand Rail) සවිමත්භාවයෙන් තොරව අනාරක්ෂිතව ඉදි කිරීම හේතුවෙන් පාසල් ළමුන් හා නරඹන්නන් අනතුරුවලට ලක් විය හැකි බව 2018 ජූනි 01 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

### 5.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

ඇස්තමේන්තුගත පිරිවැය රු.59,647,462 ක්වූ හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඕස්ට්‍රේලියානු කලාපයේ ඉදිකිරීම් කටයුතු සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සමඟ එළඹී ගිවිසුම අනුව 2017 මාර්තු 09 වන දින වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් කළයුතු වුවත් විගණිත දිනය වූ 2018 මැයි මස 30 වන දින වනවිටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර විෂයයන් 08 ක සියයට 76 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

**-----------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණිත දිනය වූ 2018 ජූනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ලේඛන පවත්වාගෙන යාම | අරමුදලින් සිදු කෙරෙන නව ඉදිකිරීම් හා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ සියලු විස්තර ඇතුළත් කොන්ත්‍රාත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ආ) තොග පාලනය | ප්‍රාදේශීය කාර්යාලවල තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ඇ) අයවැය පාලනය | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබීම. |